වෛද්‍ය කීර්ති රණසිංහ
පසර නීරෝගා වෛද්‍ය මධ්‍යස්ථානය
**14B**, නිදහස් මාවත, ඉසුරුපුර,
අනුරාධපුරය.

***0094 71 149 7058***



www.pasaraniroga.com

වෛද්‍ය කීර්ති රණසිංහ
පසර නීරෝගා වෛද්‍ය මධ්‍යස්ථානය
14B, නිදහස්මාවත, ඉසුරුපුර,
අනුරාධපුරය.
*0094 71 149 7058*

# ආයුබෝවන්

www.pasaraniroga.com

# හැඳින්වීම

- ලෝකයේ විවිධ වෛද්‍ය ක්‍රම පවතී. එම රටවල පවතින ස්වදේශීය වෛද්‍ය ක්‍රම රටේ ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියට එකතු කර ගතයුතු බව ලෝක සෞඛ්‍ය සංවිධානයේ ද අදහසයි. නමුත් මෙහිදී නිසි ප්‍රමිතිය පවත්වා ගත යුතු බව පිලිබඳව තර්කයක් නොමැත.
- ශ්‍රී ලංකාවේද නීත්‍යානුකූලව පිලිගත් වෛද්‍ය ක්ෂේත්‍ර 03 ක් හා ඒ එක් එක් වෛද්‍ය ක්ෂේත්‍රයට අයත් වෛද්‍යවරුන්ද වේ. එනම්,
- බටහිර වෛද්‍ය ක්ෂේත්‍රය
- ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය
- හෝමියෝපති වෛද්‍ය ක්ෂේත්‍රය

www.pasaraniroga.com

- ඒ එක් එක් වෛද්‍ය ක්ෂේත්‍ර වලට අදාලව වෛද්‍ය සභා 03ක් පවතින අතර එම වෛද්‍යවරුන් අදාල වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී සිටිය යුතුයි.

- මෙහිදී සිද්ධ, යුනානි හා පාරම්පරික වෛද්‍යවරුන්ද ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයට අයත් ආයුර්වේද වෛද්‍ය සභාවේම ලියාපදිංචි වේ .

- අප රටේ බටහිර වෛද්‍ය ක්ෂේත්‍ර සඳහා බොහෝ පහසුකම් සැපයේ, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය තවම එතරම් ප්‍රචලිත වී නොමැත.

www.pasaraniroga.com


# ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ ස්වභාවය

- මහා වංශයේ සඳහන් පරිදි විජය කුමරු ශ්‍රී ලංකාවට පැමිණෙන විට කුවේනි රැජිණ කපු කඩමින් සිටියාය. විජය කුමරු එසේ පැමිණෙන විට ඉංදියාවේ සිට 700ක් පමණ වෛද්‍යවරු පිරිසක් පැමිණ ඇත. මේ අනුව ඉංදියාවේ රිෂිවරුන්ගෙන් පැවත එන ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ලංකාවට ලැබී ඇත. මෙලෙස ආරාබියත් සමඟ පැවති වෙළෙඳ සබදතා අනුව යුනානි වෛද්‍ය ක්‍රමයත්, දකුණු ඉංදියාවෙන් සිද්ධ වෛද්‍ය ක්‍රමයත්, උතුරු ඉංදියාවෙන් ආයුර්වේද වෛද්‍ය ක්‍රමයත්ලංකාවට ලැබී ඇත.

- ලංකාවේ එවකට තිබූ පාරම්පරික දේශීය වෛද්‍ය ක්‍රමය සමග මෙම වෛද්‍ය ක්‍රම, විශේෂයෙන් ආයුර්වේද වෛද්‍ය ක්‍රමය මේ වන විට යම් මිශ්‍රවීමක් සිදුව ඇත.

www.pasaraniroga.com

# ආයුර්වේදය යනු......




- ආයුෂය පිළිබඳ විද්‍යාවකි.
- වෛද්‍ය ක්‍රමයක් පමණක් නොව ජීවත් විය යුතු ආකාරය පෙන්වා දෙන ජීවන දර්ශනයකි.

www.pasaraniroga.com

# ආයුර්වේදයේ අරමුණු

- නිරෝගී පුද්ගලයාගේ නිරෝගී බව ආරක්ෂා කිරීම

- රෝගී පුද්ගලයාගේ රෝග සමනය



# ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ ප්‍රධාන අංගයන් අටක් වේ. එනම්,

- ශල්‍ය තන්ත්‍රය
- ශාලාක්‍ය තන්ත්‍රය
- කාය චිකිත්සා තන්ත්‍රය
- කෞමාරභෘත්‍ය තන්ත්‍රය
- රසායන තන්ත්‍රය
- වාජීකරණ තන්ත්‍රය
- අගද තන්ත්‍රය
- භූත විද්‍යා තන්ත්‍රය

**ශල්‍ය තන්ත්‍රය :-**

ඖෂධ වලින් සුවකළ නොහැකි රෝග වලට ශල්‍ය ප්‍රතිකාර විධි (Operation) භාවිතය හා සම්බන්ධ කොටසයි

**ශාලක්‍ය තන්ත්‍රය :-**

අක්ෂකාස්ථියෙන් ඉහළ රෝග වලට (ශලාකා කූරු ආධාර කරගෙන) ප්‍රතිකාර කිරීම.

**කාය චිකිත්සා තන්ත්‍රය :-**

සාමාන්‍ය රෝග වලට (සර්වාංග රෝග) ප්‍රතිකාර කිරීම්

**කෞමාරභෘත්‍ය තන්ත්‍රය :-**

ස්ත්‍රී රෝග චිකිත්සාව, ගර්භණී චිකිත්සාව හා  බාල රෝග චිකිත්සාව මෙහිදී සිදුකරයි. කාන්තාවගේ නිරෝගී බව, නිරෝගී දරුවෙකු ලබාගැනීම හා දරුවාගේ රෝග වලට ප්‍රතිකාර කිරීම ඉලක්ක කෙරේ.

www.pasaraniroga.com

## රසායන තන්ත්‍රය :-

තරුණ බව රැකගැනීම එනම් රූපලාවන්‍ය ප්‍රතිකාර ඇති කොටසයි. ශරීරය පුෂ්ටිමත් කරන ක්‍රමද මෙහි අන්තර්ගත වේ.

## වාජීකරණ තන්ත්‍රය :-

ලිංගික ශක්තිය වැඩි කරන ක්‍රම අන්තර්ගත වේ. ප්‍රජාව පවත්වාගෙන යාම පිළිබඳව ඉලක්ක කෙරේ

## අගද තන්ත්‍රය :-

විෂ පිළිබඳව ඇති කොටස වේ. සර්ප විෂ හා නොයෙක් පාෂාණ වර්ගද ශාක ද්‍රව්‍යවල විෂද තවද කෘත්‍රිම විෂ වර්ග වලින් ඇතිවන තත්ත්වයන්ටද ප්‍රතිකාර කරයි

## භූතවිද්‍යා තන්ත්‍රය :-


නොයෙකුත් යාග-හෝම, බලි-තොවිල් ආදිය මගින් කරන ප්‍රතිකාර විධි මෙයට අදාළ වේ.

# ඉතිහාසය



මැදිරිගිරිය රෝහල

www.pasaraniroga.com



මිහින්තලේ රෝහල

www.pasaraniroga.com

# නවීන ශල්‍ය වෛද්‍ය විද්‍යාවට මූලික ආරම්භය ආයුර්වේදය බව

| අෂ්ටවිධ ශස්ත්‍ර කර්ම භාවිතවන නම | නවීන වෛද්‍ය විද්‍යාවේදී |
|---|---|
| ඡේදනය | Excision |
| භේදනය | Incision |
| ලේඛනය | Scraping |
| වේධනය | Puncturing |
| ඒෂණය | Probing |
| ආහාරණය | Extraction |
| විස්‍රාවනය | Draining |
| සීවනය | Suturing |

| ආයුර්වේදයේ නම | නවීන වෛද්‍ය විද්‍යාවේ |
|---|---|
| ඍජුග්‍රන්ථි | Interrupted sutures |
| වෙල්ලීත | Continuous/spiral sutures |
| ගෝඵනිකා | Blanket sutures |
| තුන්නසේවනී | Sub cuticular |

**ඍජු ග්‍රන්ථි (Interrupted sutures)**

මෙය නැමෙන දිග හැරෙන සන්ධි වලට වඩා සුදුසුය. මැහුමෙන් මැහුමට ගැට දමන නිසා එක් පොටක් කැඩුණද දිගටම ලිහීමක් සිදු නොවේ.

**වෙල්ලීතක (Continuous/spiral sutures)**

මෙය ලේ ගැලීම් වැඩි අවස්ථා ආදියට සුදුසුය. එක දිගටම මැසීම සිදුකරයි.

**ගෝඵනිකා (Blanket sutures)**

ස්ථර කීපයක් වැඩීමට ඇති විට වඩා සුදුසු මෙය මැස්ම කපන විට එකිනෙකට වෙන වෙනම කැපිය යුතුය.


**තුන්නසේවනී (Sub cuticular)**

මුහුණ ආදී ස්ථානවල කැලැල් ඇතිවීම වැළැක්වීමට මෙම ක්‍රමය යොදා ගනී.


## සුශ්‍රැත සංහිතාවේ සූත්‍රස්ථානයේ 08වෙනි අධ්‍යායේ 03 වන ශ්ලෝකයේ පරිදි ශල්‍ය උපකරණ 20 නම් වශයෙන් මෙසේ ය.


- 01. මණ්ඩලාග්‍ර ශස්ත්‍රය
- 02. කරපත්‍ර ශස්ත්‍රය
- 03. වෘද්ධිපත්‍ර ශස්ත්‍රය
- 04. නඛශස්ත්‍ර ශස්ත්‍රය
- 05. මුද්‍රිකා ශස්ත්‍රය
- 06. උත්පල ශස්ත්‍රය
- 07. ආර්ධධාරා ශස්ත්‍රය
- 08. සූචි ශස්ත්‍රය
- 09. කුශපත්‍ර ශස්ත්‍රය
- 10. ආටීමුඛ ශස්ත්‍රය
- 11. ශරාරීමුඛ ශස්ත්‍රය
- 12. අන්තර්මුඛ ශස්ත්‍රය
- 13. ත්‍රිකූර්චක ශස්ත්‍රය
- 14. කුඨාරිකා ශස්ත්‍රය
- 15. ව්‍රිහීමුඛ ශස්ත්‍රය
- 16. ආරා ශස්ත්‍රය
- 17. වේතසපත්‍ර ශස්ත්‍රය
- 18. වඩීශ ශස්ත්‍රය
- 19. දන්ත ශංඛු ශස්ත්‍රය
- 20. ඒෂණි ශස්ත්‍රය

# නවීන වෛද්‍ය විද්‍යාවේ භාවිතා කරන ශල්‍ය උපකරණ කිහිපයක්












www.pasaraniroga.com





# අතීතයේදී ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ භාවිතා කළ ශල්‍ය උපකරණ කිහිපයක්




www.pasaraniroga.com














www.pasaraniroga.com





www.pasaraniroga.com













www.pasaraniroga.com

# එදා, ආයුර්වේද ශල්‍ය කර්ම



# එදා, ශරීරය ගැන දැනුම



# අපේ පැරණි උරුමයන්




www.pasaraniroga.com


8
බෙහෙත් හෙප්පු සහ
මංජුසා
6
7
තෙල් කරඬිය

# වෛද්‍යවරයාගේ ස්වභාවය

**වෛද්‍යවරු**

BAMS ( Bachelor of Ayurvedic Medicine and Surgery/ ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවෛද්‍ය උපාධිය )
උපාධි පාඨමාලාව හැදෑරූ වෛද්‍යවරු වෙති.

**BAMS පාඨමාලාව**

කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත
දේශීය වෛද්‍ය විද්‍යායතනයේත්

කැළණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධිත
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද වෛද්‍ය විද්‍යායතනයේත් පැවැත්වේ.

**වෛද්‍ය සිසුන්ට ප්‍රායෝගික පුහුණුව**

බොරැල්ල ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල

• මීට අමතරව,

**BUMS (Bachelor of Unani Medicine and Surgery/ යූනානි වෛද්‍ය හා ශල්‍යවෛද්‍ය උපාධිය)**

- කොළඹ විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යායතනයේ පැවැත්වේ.

**BSMS (Bachelor of Sidda Medicine and Surgery/ සිද්ධ වෛද්‍ය හා ශල්‍යවෛද්‍ය උපාධිය)**

- යාපනය හා නැගෙනහිර විශ්ව විද්‍යාල වල සිද්ධ දෙපාර්තමේන්තුවල පැවැත්වේ.

යාපනයේ කයිතඩි ශික්ෂණ රෝහල මෙම සිසුන්ට ප්‍රායෝගික පුහුණුව ලබා දේ.

# BAMS උපාධි පාඨමාලාවේ ස්වභාවය

<u>බඳවා ගැනීමේ පටිපාටිය</u>

- අනිකුත් විශ්ව විද්‍යාල වල මූලික උපාධි පාඨමාලාවලට සිසුන් බඳවා ගන්නා ලෙසම වේ.

- BAMS උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා උසස් පෙළ ජීව විද්‍යා අංශයෙන් එනම්, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව යන විෂයන් හදාරා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මගින් ඒ ඒ වර්ෂ වල උසස් පෙළ විභාගයට අදාලව දිස්ත්‍රික් පදනම මත ප්‍රකාශයට පත් කරන Z ලකුණු අනුව විශ්ව විද්‍යාල ප්‍රවේශය ලැබිය යුතුයි.

## පාඨමාලාවේ අන්තර්ගතය

- ඉතාම දළ වශයෙන් හා මූලික වශයෙන් ආයුර්වේද මූල ධර්ම රෝග නිර්ණය හා චිකිස්සා ක්‍රම සමග බටහිර වෛද්‍ය ක්‍රමයේ මූලධර්ම ප්‍රතිකාර අධ්‍යයනය, දේශීය (පාරම්පරික) චිකිස්සා ක්‍රම, මළ ශරීර විච්ඡේදනය (කාය විච්ඡේදනය /Human Anatomy) ප්‍රායෝගිකව සිදු කිරීමෙන් හා විද්‍යාගාර පරීක්ෂණ ප්‍රායෝගිකව සිදු කිරීමෙන් හා නීති වෛද්‍ය විද්‍යාව (අධිකරණ වෛද්‍ය විද්‍යාව) ආදී විෂයන් හදාරමින්
- පැරණි වෛද්‍ය විද්‍යා දැනුම නවීන වෛද්‍ය විද්‍යා දැනුම හා වෛද්‍ය තාක්ෂණික ඥානය මුසුකොට නවීන සමාජයට ලබා දීමට අදාලව සැකසුනු විෂය කරුණු අඩංගුය.

# ඊට අමතරව

- පැරණි දැනුම ලබා ගැනීමට සංස්කෘත භාෂාව ජ්‍යෝතිෂ්‍ය මූලධර්මද අන්තර්ගත වේ.
- නවීන ලෝකය හා සම්බන්ධවීමට පරිගණක දැනුම, ඉංග්‍රීසි භාෂාව මෙන්ම පර්යේෂණ ක්‍රමවේදය ද අන්තර්ගතය .
- මෙම උපාධි පාඨමාලාව අධ්‍යයන වර්ෂ 5 ක් හා සීමාවාසික පුහුණුව අවුරුද්දක් ලෙස සම්පූර්ණයෙන් වර්ෂ 6 කි.

# අද


ජාතික ආයුර්වේද (ශික්ෂණ) රෝහල
බොරැල්ල - කොළඹ 08
தேசிய ஆயுர்வேத (போதனா) வைத்தியசாலை
பொரல்லை - கொழும்பு 08
NATIONAL AYURVEDIC (TEACHING) HOSPITAL
BORELLA - COLOMBO

රෝහල


බොරැල්ල ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල


සායනික කටයුතු හා වෛද්‍ය සිසුන්


සායනික කටයුතු.......


වෛද්‍ය සිසුන්ගේ සායනික පුහුණුවීම්.......


ළමා රෝග වාට්ටුව........



කාන්තා රෝග හා සායනික කටයුතු.......

# ඉන්දියාවේ ආයුර්වේද රෝහලක නවීන ශල්‍යාගාරයක්



www.pasaraniroga.com

# නවීන ආයුර්වේද ඖෂධ කීපයක ඡායා රූප



















# පංචකර්ම චිකිත්සාවේ අවස්ථා කිහිපයක්













# කූඩැල්ලන් යොදාගෙන රක්ත මෝක්ෂණය සිදුකිරීම










# ක්ෂාර සූත්‍ර චිකිත්සාව









# අද, ආයුර්වේද අධ්‍යාපනය





වෛද්‍ය සිසුන්ගේ විද්‍යාගාර පරීක්ෂණ හා පුහුණු වීම්.......

www.pasaraniroga.com

කලා කටයුතු








පරිගණක විද්‍යාගාර හා පුස්තකාල පහසුකම්............



මුඛ රෝග සඳහා ප්‍රතිකාර.......




මෘත ශරීර විච්ඡේදනය හා අධ්‍යයන කටයුතු කරමින්.......





සන්දි රෝග සඳහා ප්‍රතිකාර



www.pasaraniroga.com

# ප්‍රතිකාරයේ විශේෂතා








www.pasaraniroga.com

## Cervical Spine Lateral




## Cervical spondylosis




මෙවැනි රෝග තත්ත්ව සඳහා බටහිර වෛද්‍ය
ක්‍රමයේ නොමැති ඖෂධ ..........

# ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයට අදාල වෛද්‍යවරුන් රාජ්‍ය සේවයට බඳවා ගැනීම හා වැටුප් පරිමාණය

- කැළණිය හා කොළඹ විශ්ව විද්‍යාල වලින් පිටවන BAMS උපාධිධාරි වෛද්‍යවරු (වසරකට 200ක් පමණ පිටවේ.) කුසලතා අනුපිළිවෙලට රාජ්‍ය සේවයට බඳවා ගනී.

**තනතුර**

- *ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධර සංණයේ ප්‍රාථමික ශ්‍රේණියේ **වෛද්‍ය නිලධාරි*** තනතුර

**මූලික වැටුප**

- රු.54,290.00 කි ( 3/2016 වැටුප් චක්‍රලේඛය අනුව වර්ෂ 2020 දී)

**පත්වීම් බලධාරියා**

- රාජ්‍ය සේවා කොමිෂන් සභාව

www.pasaraniroga.com



# ස්තුතියි.


වෛද්‍ය කීර්ති රණසිංහ
(B.A.M.S. කැළණිය විශ්වවිද්‍යාලය)

**WEB:** www.pasaraniroga.com

**EMALE:** drkeerthi@pasaraniroga.com

**PHONE:** (+94) 071 149 7058